# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 2171635<br>10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011- |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1548/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 06/10/2024<br>පැය 1345 |


## මාධ්‍ය නිවේදනය

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

**01. තීරු බදු රහිතව මෙරටට ගෙන්වන ලද දුම්වැටි සමඟ සැකකාරියක් සහ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය.**

2024.10.06 වන දින අළුයම් කාලයේ කටුනායක ගුවන්තොටුපල පරිශ්‍රයේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර අබුඩාබි සිට තීරුබදු රහිතව මෙරටට රැගෙන එන ලද **දුම්වැටි 24200 ක් ( කාටුන් 121) සමඟ** **සැකකාරියක්** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 23 ක් වන දෙහිඕවිට ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

2024.10.06 වන දින අළුයම් කාලයේ කටුනායක ගුවන්තොටුපල පරිශ්‍රයේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර අබුඩාබි සිට තීරුබදු රහිතව මෙරටට රැගෙන එන ලද **දුම්වැටි 24600 ක් ( කාටුන් 123) සමඟ** **සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වන පානදුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. තීරු බදු රහිතව මෙරටට ගෙන්වන ලද බීඩි කොළ තොගයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - නොරොච්චෝලය පොලිස් ස්ථානය.**

2024.10.06 වන දින අළුයම් කාලයේ නොරොච්චෝල පොලිස් වසමේ ඉලංතඩිය ප්‍රදේශයේදී නොරොච්චෝලය පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර ප්‍රවාහනය සඳහා සූදානම් කර තිබූ තීරුබදු රහිතව මෙරටට රැගෙන එන ලද **බීඩි කොළ කිලෝ ග්‍රෑම් 2463 ග්‍රෑම් 400 ක් , ලොරි රථයක්, සහ වෑන් රථයක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වන ගලේවෙල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

ලොරි රථයේ රියදුරු පලා ගොස් ඇති අතර සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා නොරොච්චොලය පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**